# සක්විතිලා දැක්ම හා රැක් අත්තන මල



ඒ. ඩී රන්ජිත් කුමාර නම් වූ කතුවර ලේඛකයා , චිත්‍ර ශිල්පියා ,සිනමාවේ රසමුසු බව පරිපූර්ණ කරන්නට තම හැකියාව සුසංයෝජනය කල රසවතා අද දවසේ මතකයට නැගෙන්නේ 80 දශකයේ සොඳුරු වට පිටාවන් යලිදු මතක් කරමින්. ඔහුගේ ප්‍රියාදර බිරිඳ වන දමයන්ති ජයසූරිය මොරටුවේ කල්දෙමුල්ල ගමට සිටිනාවූ තවත් ගීත කෝකිලවියකි. සුපුරුදු අවට වැසියන්ගේ ආදර ගෞරවයට පාත්‍ර වූ දමයන්ති අක්කා මා දකින්නේ සුහද වූ සහෝදර භක්තියකිනි. බොහෝ දවස්වල රන්ජිත් කුමාරයන් දමයන්ති අක්ක මුණ ගැසීමට නිවසට විත් යනෙන අතර වාරය තුළ මටද බස් නැවතුම් පොලේදී මුණගැසේ. සුහදශිලියකු ලෙස අව්‍යාජ සිනහවක් පිළිගන්වමින් බසයට ගොඩවන අයුරු මා සිතන්නේ කවදාද මොහු හා කතාකරන්නේ යන බලාපොරොත්තුව ඇතුවයි .

ඒ වකවානුව වනවිට මා පාසල් කාලයට අමතරව සති අන්තයේ බන්දුල හරිශ්චන්ද්‍ර චිත්‍ර ශිල්පී ගුරුතුමාගෙන් චිත්‍ර ශිල්පය හදාරමින් සිටියෙමි. යම් යම් තැන් වලදී රන්ජිත් කුමාරයන් ඇඳි හුරු බුහුටි පොත් කවර, චිත්‍රපට නාමාවලි දකින විට ඔහු හා කතා බහ කිරීමේ සිතුවිල්ල මතුවේ. චිත්‍ර ශිල්පියකු ලෙස මා ගාලු මුවදොර පිහිටි ටර්බඑ නැබහදබ වෙළඳ ප්‍රචරකයතනයට රැකියාවට ගියෙමි. කලක් ගතවී රන්ජිත් අය්යා කල්දෙමුල්ලේ පදිංචියට ආපසු මගේ ගමට අමුත්තකු නොවූ ඔහු රිසිසේ කතා බහ කිරීමට මුණගැසිනි. අපි අපේ කලාව ගැන කතා කළෙමු. ඔහු බොහෝ වෙලාවට ඔහුගේ කටයුතු වලට මා සහභා ගී කර ගත්තේය. එය මගේ ඉදිරි ගමනේ අත්වැලකි. මෙතැන් පටන් අපි සහෝදර එකමුතුවෙන් කලා කටයුතුවල නියලූනෙමු. රන්ජිත් අය්යා හා දමයන්ති අක්කාගේ නොමදවූ කාරුණික භාවයන් මගේ සිතට එදා ගෙන දුන්නේ නැවුම් වූ දිරියකි. රන්ජිත් අය්යාගේ උත්සාහයන් දිනෙන් දින මල් පළ ගැන්වෙමින් සති අන්ත සරසවිය සිනමා පුවත් පත තවත් ඉහලට එසැවිණි. සරසවිය සිනමා පුවත් පතේ කතුවර තනතුර ඔහු සොයා ආවේය. ඔහුගේ අරමුණ වූයේ පුවත් පතට නවතාවක් ලබාදෙමින් ලිතෝ මුද්‍රිත කවරයක් යොදා සරු ලිපි හා විශේෂාංග ඇතුලත් කිරීමටයි. මේ කටයුත්තේදී පළමුවෙන්ම මා හා කතා බහක යෙදුනේය. ඔහුගේ මට ලැබුන ආරාධනාව පරිදි කවරය අලූත් ආකාරයකට නිම කරන්නටත් , ඇතුලත පිටු හා විශේශාංග වල සිරස්තල වල නිමවීම් කරන්නටත් මට හැකි උනා.. සිනමා පුවත් පත අලූත් වෙනසක් වුනා. අපි වෙනසක් කලා. ඒකාලේ digital තාක්ෂණයක් ඉහලින් තිබ්බේ නෑ. සමහරු calander එකක colour seperation ගන්නත් සිංගප්පුරුවට දුවනවා. අඩු තාක්ෂණයකින් වැඩි අලංකාරයක් ගන්නනම් නිර්මාණ ශිල්පියා දක්ෂයෙක් විය යුතුමයි .

සරසවියේ කවරවල ඡායාරූ බොහෝ වෙලාවට ලැබුනේ ප්‍රියන්ජන් සුරේෂ්, සුසන්ත ලියනවත්ත හා දී .ග. සෝමපාලයන් අතින්. මා සරසවියට පිටින් ඉඳ නිර්මාණ කලත්, එහි අලංකාර කිරීම උදෙසා හැම මොහොතකම නියැලූනා. එහි අනෙකුත් සිටිය සියල්ලෝම කැපවීමකින් වැඩ කලා. විශේෂයෙන් රන්ජිත් කුමාර නම්වූ මේ පුද්ගලයාට එය ගෙනියන්නට හැකි හැම අයුරින්ම ඔවුන් උදව් කලා. දැනට ඉන්නා කතුවර අරුණ ගුණරත්නත් එකල සරසවියේ විශේෂාංග ලේඛකයෙක්. ඔහුද සමහර වෙලාවට මා රැකියාව කරන ආයතනයට පැමිණියා පුවත් පතේ අදාල නිර්මාණ රැගෙන යන්නට. එදා අපිත් සමග උන්නු සරසවි මිතුරන් කීප දෙනෙක් අපෙන් සමු අරන්. නාට්‍ය අධ්‍යක්ෂක, ලේඛක සුසිල් ගුණරත්න එවැන්නෙක්. විමල් තිලකරත්න අප හැර ගොසින්, එදා අනුර බණ්ඩාර රාජගුරු, ලතා බොතේජු , සුනිල් මිහින්දුකුල, සමන්ත හේරත්, මිහිරි ෆොන්සේකා වැන්නවුන්ගෙන් සරසවිය තව තවත් හැඩවුනා. අගනා සමරු කලාප කරන්නට, සරසවි සම්මාන උළෙල විචිත්‍රවත් උනෙත් නව ආරම්භයකට මුල පිරුවෙත් රන්ජිත් කුමාරගේ කාලයයි .

අති ධාවනකාරී වැඩ කටයුතු කළ කාල වකවා-නුවක මීට පෙර වූ සිදුවීමක් මතකයට ඇතුලත් කරන්නට මට සිත්වුනි. මේ ආරාධනාව කරන්නේද රන්ජිත් අය්යා විසින්මය . සිනමාවට කලාවට ආදරය කල රන්ජිත් අය්යා සිනමාවේ සක්විතිගේ දෙයක් වේනම් නොපිරිහෙලා ඉටුකළේය. "අතුල මල්ලී හදිසි කාරණාවකට අද මුණ ගැහෙන්න....ඉක්මනින් කලයුතු වැඩක් .." මේ දුරකථන පණිවුඩය මට ප්‍රෙහේලිකාවකි. එනි සාම එක එක සිතුවිලි සිතට නැගුනේය. රන්ජිත් අය්යාට කරදරයක්ද? එලෙස සිතුනේ එවකට පත්තර කන්තෝරු තුලද පසුදින උදය වනවිට තමුන්ගේ පුටුවේ තවෙකකු හිඳ ගැනීමේ සිරිතක්ද පැවතී භීතිය නිසාවෙනි. සවස මුණගැසීමෙන් පසු ඒ පිලිබඳ සිතුවිලි වෙනස් කළේය.

"අපේ ගාමිණී මහත්තයා මාතරට තරග කරනවා . අතුල තමයි ad champaign එක කරන්න ඕන ..මම ගාමිණී මහත්තයට කියල තිත්තේ.." රන්ජිත් අය්යා සියල්ල සුදානමින් කියනාවිට "හිතන තරම් ලේසි වෙන්නේ නැහැ මාතරට එච් .ආර් .පියසිරි මහත්තය නේද ඉල්ලන්නේ. සෑහෙන වැඩක් කරන්නවේවි.." මගේ අදහස ප්‍රකාශ කළෙමි .

ලහි ලහියේ මේ කාර්යය කරන්නට වෙහෙසුන මාහට ගාමිණී මහතාගේම සිතුවිල්ලකට අනුව " හෙට ඉපදෙන රුහුණ" නමින් ප්‍රචාරක කටයුතු කරන්නට ඉඩ ප්‍රස්ථාව සැලසිනි. පුවත් පත් දැන්වීම් ඇතුළු ප්‍රචාරක වැඩකටයුතු රාශියක් රන්ජිත් අය්යා සහ සනත් නම් වූ ගාමිණී මහත්මා ගේ සංවිධායක වරයකු හරහා මවෙත ලැබෙන්නට විණි . මා අතින් ඉටුවිය යුතු ප්‍රචාරක නිර්මාණ කාර්යන් නොපිරිහෙලා ඉටු කරන්නට වග බලාගතිමි. ඒ වෙනුවෙන් එතුමා අවැසි ද මුදල් නිසි වෙලාවට ලබාදුනි. කලට වෙලාවට කළ අපේ වැඩ කටයුතු ඉතා ඉහලින් සාර්ථක විනි.

මාතරින් වැඩි චන්ද ගණනාවක ජයග්‍රහණය අත්කරගත් සිනමා සක්විති ගාමිණී ෆොන්සේකා මහතා 1989 මාර්තු 9 වැනිදා නියෝජ්‍යය කතා නායක ධුරන්ද්‍රයද රැගෙන පාර්ලිමේන්තුවට සම්ප්‍රාප්තවිය. ඔහුගේ සියලූ කටයුතු සම්පූර්ණ කරගන්නට මා කල සේවාවන් වෙනුවෙන් පිරිනැමූ වර්ණනාවන් සහිතවූ විශේෂ වූ ලිපියක් මවෙත රන්ජිත් අය්යා විසින් ගෙන එන ලදී. ඒ ලිපිය අදටද මා සුරැකිව ළඟ තබාගෙන ඇත්තෙමි. මට කොතෙක් අවස්ථා තිබුනත් එතුමා හමුවී උදව් උපකාර ගන්නට මා ඒ අවස්ථාවන් මගහැරියේ පක්ෂ ගණනක අනෙකුත් මැති ඇමති වරුන්ගේද මෙවැනි සේවාවන් හා යෙදී උදව් උපකාර බල පොරොත්තු නොවූ හෙයිනි. අනෙක එවැනි උපකාර ගන්නට තරම් මට අවශ්‍යතා නොතිබූ හෙයිනි. මට කියා පක්ෂයක් තිබුනද යන්නද මට අදට ද ගැටලූව කි. මා එක් එක් දේශ පාලන පක්ෂ වල නිර්මාණ කටයුතු වල නියැලෙද්දී එහි ඇති ප්‍රෝඩාකාරී ස්වභාවය තේරුම් ගත්තෙමි. එනමුදු




සිනමා සක්විති දේශපාලනයේ කටයුතු කරනඅයුරින් පුද්ගලයන් හමුවන්නේ කලාතුරකිනි ..ඔහු සැබවින් කලාවට මහ-ජනයාට ආදරය කළේය. විජය කුමරතුංගයන්ද මේ මනුස්ස කුලයේ ජීවත් වූවෙකි. මේ කාලය අතර තුරදී Grant kenyon අවුරුදු 10 යක සේවාවෙන් ඉවත් වී Irwin Weerackkody මහතාට අයත් Phoenix advertising ආයතනයේ කලා අධ්‍යක්ෂක දූරය සඳහා වැඩ කටයුතු බර ගතිමි . කතා බහ යෙදෙන අතර තුරේ තමා සරඅසබ මහත්මා දැනගත්තේ මම තමා මාතර ප්‍රචාරණයට හවුල් උනේය කියා. එතුමාද ගාමිණී මහත්ම ලගින්ම සිටින හොඳම මිතුරකු බව දන ගන්නට ගියේ සුළු මොහොතකි.

දිනෙක ගාමිණී මහත්මත් සමග සරඅසබ මහත්මා studio tකට පැමිණියේය . ගාමිණී මහතා මුණ ගැසිනි . ඔවුන් දෙදෙනාගේ හදිසි පැමිණීම නිසා හුදෙකලාව ගාමිණී මහත්මා හා කතා කිරීම කෙටි කතාවක් වුනි. අනෙක දේශ පාලන කටයුතු වල දේවල් කතා කරන්නට එතන පරිසරයක් නොවෙන බව පැහැදිලිය. ""කොහොමද... මම දන්නවා දැන් මෙතැනයි ඉන්නේ කියාලා. හොඳයි නේද?" ඇසු දෙයට මගේ ගෞරවය ඔහුවෙත පාමින් හොඳින් ඉන්නවා කීවෙමි ..ඔහුගේ කියමනෙන් මා තේරුම් ගත්තේ මා නොදන්නවා උනත් මා වෙනුවෙන් යම් ප්‍රසාදයන් ඔහු විසින් ආයතනයේ හිමි කරුට පවසා ඇති වගකි . කලා නිර්මාණ වලට කවදත් හිතැති එතුමා නිර්මාණ ශිල්පීන්ගේ නිර්මාණ බලමින් යන අතර අපේ හිතවත් ලකී ලියනගේ කලකට පෙර සිතුවම් කල ගාමිණී ෆොන්සේකාගේ සිතුවමපෙන්වීය. සිනමා සක්විතිගේ දෑස දැල්වී ඒ රුව දිහාම බලගන ඉන්නට විනි.

මොකක්ද නම ...ලකී නේද..ලකී මට මේකේ යමක් ලියන්නට පුලූවනිද...එතුමා විසින් ඇසු සැනින් අපේ මිත්‍රයා එකවරට දෙවරක් කැමැත්ත පළකළේය. "මා දක්ෂයකු වුවාට ඔබ ඔබේ වෘත්තියෙන් දක්ෂයෙකි" යන්න ඒ සිතුවමේ ලියා අත්සනක්ද ගැසුවේය.. මෙවදන ලියා අහිංසක සිනාවකින් එතුමා ලකිට සංග්‍රහ කලේ සිත ඇතුලාන්තයේ ඉන්න කලාකරුවාගේ විනිවිද භාවය හඟවමිනි.

1991 වසරයි.නොසිතු නොපැතූ මොහොතක මා පැදි යතුරු පැදිය අනතුරකට භාජනයවී රෝහල් ගත වන්නට සිදුවිය . බිරින්දෑට පළමු දරුවා පිළිසිඳගත් මුල්සමයේ මෙවැනි අනතුරකට භාජනයවී ලොකු අනතුරක් නොවී බේරෙන්නට ලැබීම පෙර කල පිනක්මයි සිතන්නට වෙර දැරීමි. මොහොතක් හෝ නිකන් නොසිට කුමන හෝ වැඩක නිරතවෙන මා ඇඳකට වී දැඩි කනස්සල්ලකින් වුවද එය මග හැර ගන්නට මසක පමණ කාලයක් ගතකලේ පොත පත හා ගීතය ඇසුරෙන් මානසිකව සහනයක් ලබමිනුයි . මේ අතර තුර කාලයේදී දවසක බිරින්දෑ මා උනන්දු කරන්නේ 91 වසරේ ලංකාවේ පැවැත්වෙන සාෆ් ක්‍රීඩා තරග යට සම්බන්ධව ගුවන් විදුලි සංස්ථාව පවත්වනු ලබන සාෆ් ගී තරගයටයි. ඇගේ උනන්දුව මත මම ලෙඩ ඇඳේ සිටම තරග වදින්නට ගීතය ලියුවෙමි. එහි මුල් පදවැල් මෙසේයි .

සිව් දෙසින් අත් සිත් එකට බැඳ ..
දේශ දේශේ ජාති සමගින
ආසියාවේ ප්‍රදීපය වෙමු
අපේ මුතු බිම ලංකා දීපේ ...
ජාතියේ නැගෙන ඔල්වරසන් හඬයි
දේශයේ සැවොම එක මවකගේ ළමයි..

බිරිඳ එය තැපෑලට දමා ඒ කර්තව්‍යයත් නිම කළාය.

දින සති ගෙවී ගොස් මා සුපුරුදු සුවයට ගෙනෙන්නේ නැවුම් ලෝකයකට අඩිය තබන විලාසයකිනි. කාමරයකට ඇඳකට සීමාවී සිටි මා අලූත් සුළඟක් , අලූත් දවසක් වැළඳ ගන්නනේ වෙනදාටත් වඩා ආශාවකිනි. රැකියාවට යන දින ගණන් ගැන්නේද මා කරන රැකියාව මගේ විනෝදාංශයේ කොටසක් නිසාවෙනි. රැකියාවට ගොස් එන සවසක බිරිඳ පෙර මගට සතුටු පණිවුඩයක් රැගෙන් එයි...ඔයාගේ ගීය තේරිලා..මම කිව්වේ ෂුවර් එකට ඔයා ලිව්වොත් හරි කියල..සතුටේ නිමක් නැත..මෙය ඇසූ කාර්යාලයේ හිතවතුන් සතුටුවුව වගේම හොඳ පාටියක් සෙට් කරන්නැයිද යෝජනා කළේය. දින කිහිපයකට පසු ගුවන් විදුලිය සංස්ථාව හා රිචඩ් පිරිස් සමගම එක්ව උත්සවයක් සංවිධානය කළේය . මෙහිදී මා දෙවැනි ස්ථානයට හිමි සහතික පත් හා මුදල්මය චෙක් පත් එවකට සිටි ගුවන් විදුලි සංස්ථාවේ සභාපති හඩ්සන් සමරසිංහ මහතා අතින් රැගෙන ගුවන් විදුලි සකච්ඡාවකටද සහභාගි වීමි.

ආසියාතික ක්‍රීඩා උලෙලෙකට ක්‍රීඩා නොකළත් ගීයකින් හෝ සහභාගී වන්නට ලැබීමත් එක්තරා වාසනාවක් යයි මා සාකච්ඡාවේදී සඳහන් කලෙමි. මේ සියල්ල නිම කොට ගියේ මගේ එනතුරු මිතුරන් බලා සිටින ස්ථානයටයි . එදා ඉබ්බන්විල හන්දියේ තිබූ ටීක්ංහ හෝටලයටයි. සාමාන්‍යය තරු පන්තියේ හොටලයක්ව පැවති එතන කතා බහට අරුම ඉසව්වකි. හෝටලයේ පහත මාලයට එකතුවූ අපේ හිතවත්තු සව්දිය පිරූහ. මෙසේ අපි කතා බහින් හා විනෝද වන අවස්ථාවේ එක්තරා කෙළවරක මීවිතක් තොලගාමින් පොතක් බලන පුද්ගලයකු නෙත ගැටේ.. එකෙකු ඔහු හඳුනා ගනී. .ඒයි ..රැක් අත්තන මල මචන්.. රැක් අත්තන මල ,,. ඒ ඉන්නේ අල්ගම අය්යනේ ...මහින්ද අල්ගම

19 වන පිටට